ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
Gampaha Wickramarchchi University of Indigenous Medicine
கம்பஹா விக்கிரமாராச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகம்
නුවර පාර, යක්කල. | Kandy Raod, Yakkala | கண்டி வீதி, யக்கல.

# Academic Establishment Branch

## Internal Memo

My No.: GWUIM/AE/INS/2023

Your No.:

Date: 2023.06.02

From.: ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන

To.: සියළු ම පීඨාධිපතිවරු / අධ්‍යක්ෂවරු / අධ්‍යානාංශ ප්‍රධානීන් / අංශ ප්‍රධානීන්

Through:

Subject: ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා වන සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය - 2023/2024

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්යය මණ්ඩල සමාජික භවතුන් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග පැවති සෞඛ්‍ය රක්ෂණාවරණය 2023.05.31 දිනෙන් අවසන් වූ අතර 2023.06.01 දින සිට නො. 79, ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර මාවත, කොළඹ 01 ලිපිනයේ ඇති කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ආයතනය (Continental Insurance Lanka Limited), විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවක භවතුන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණාවරණය ලබා දීමට තෝරා ගෙන ඇත.

මෙම රක්ෂණ යෝජනාක්‍රමය සඳහා 2023.06.01 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියළු ම කාර්යය මණ්ඩලයට අයදුම් කළ හැකි අතර එය සාර්ථක කර ගැනීම සඳහා ඔබ අංශයේ සිටින සියළු ම ස්ථිර කාර්යය මණ්ඩල සමාජිකයින්ගේ අවධානයට මෙය යොමු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමි.

අ. රු. 500,000/-, රු. 300,000/-, රු. 200,000/-, රු. 40,000/- සහ රු. 100,000/- (බාහිර ප්‍රතිකාර සහිත හා රහිත) වශයෙන් රක්ෂණාවරණ 05 හඳුන්වා දී ඇත.

ආ. රු. 40,000/- සහ රු. 100,000/- (බාහිර ප්‍රතිකාර සහිත හා රහිත) යන රක්ෂණාවරණ 02 මගින් අදාල සේවකභවතා **පමණක්** ආවරණය වේ. ඔහුගේ / ඇයගේ පවුල් ඒකක මෙමගින් ආවරණය නොවේ.

ඇ. රු. 40,000/- සහ රු. 100,000/- (බාහිර ප්‍රතිකාර සහිත හා රහිත) වශයෙන් රක්ෂණාවරණ 02 මගින් රජයේ රෝහල් වල නැවතී ප්‍රතිකාර ලබා ගැනීම සඳහා **පමණක්** වලංගු වේ. පුද්ගලික රෝහල්ගත වීම් ආවරණය නොවේ.

ඈ. රක්ෂණ සමාගම විසින් අනුමත පුද්ගලික රෝහලක රෝහල් ගත වීමක දී වාර්ෂික සීමාවට යටත් ව රු . 500,000/-, රු. 300,000/-, රු. 200,000/- රක්ෂණාවරණ සඳහා ගෙවීම් කරනු ලැබේ . එහිදී රෝහල් ගත වීම් වෙනුවෙන් ලබා ගන්නා අමතර ආහාර , විටමින් වර්ග සඳහා වන ගෙවීම් රක්ෂණ සමාගම මගින් ගෙවනු නොලැබේ.

ඉ. රක්ෂණ සමාගම විසින් අනුමත පුද්ගලික රෝහලක රෝහල් ගත වීමක දී රක්ෂණ කාඩ් පත තුලින් On the spot payment ක්‍රමය රු. 500,000/-, රු. 300,000/-, රු. 200,000/- යන රක්ෂණාවරණ සඳහා පමණක් වලංගු වේ.

ඊ. රු. 500,000/-, රු. 300,000/-, රු. 200,000/- රක්ෂණාවරණ සඳහා රජයේ නොගෙවන වාට්ටු වල සිදු වන දරු උපත් වෙනුවෙන් රු . 10,000/- (තනි දරු) හෝ රු. 20,000/- (නිවුන් දරු) ගෙවීමක් අභ්‍යන්තර රෝගී උපරිමය (indoor limit) තුළ ගෙවනු ලැබේ.

උ. එක් දින ශල්‍යකර්ම රු. 500,000/-, රු. 300,000/-, රු. 200,000/-, රක්ෂණාවරණ මගින් indoor limit තුල ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවනු ලැබේ.

ඍ. දරු උපත් හා සම්බන්ධ සංකූලතා සහ මද සරුභාවය සඳහා වන ප්‍රතිකාර වෙනුවෙන් (කොන්දේසි සහිත ව) indoor limit තුළ ගෙවීම් කරනු ලැබේ.

එ. රජයේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර , ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් නියම කරන ලද PCR හෝ Antigen පරීක්ෂණ කොවිඩ් 19 ඇතුළු වසංගත රෝග සඳහා ප්‍රතිකාර ගැනීම්, ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් නියම කරන ලද එන්නත් (කොවිඩ් එන්නත් හැර) ආදිය බාහිර රෝගී සීමාවන් තුළ ආවරණය කරනු ලැබේ.

ඒ. රෝහල් ගත වීමකට පෙර හා පසු රෝහල් ගතවීමට අදාල රෝගී තත්වය වෙනුවෙන් වැය වන වියදම් දින 30 ක සීමාව තුල කොන්දේසි සහිත ව ආවරණය කරනු ලැබේ.

ඔ. ඇස් කණ්නාඩි සඳහා කොන්දේසි සහිත ව රු. 15,000/- ගෙවීමක් ද රු. 40,000/- රක්ෂණාවරණය සඳහා රු. 8,000/- ගෙවීමක් ද රක්ෂණාවරණ කාලය තුළ සේවක භවතා සඳහා ලබා ගත හැකි වේ.

ඕ. දරුවන් සඳහා වයස් සීමාව (0- 25) (අවිවාහක සහ රැකියා විරහිත) වේ.

රක්ෂණාවරණ තොරතුරු

1. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 2023.06.01 දින සිට 2024.05.31 දින දක්වා (එම දින 2 ද ඇතුළු ව) වලංගු වේ.
2. මෙම රක්ෂණ ක්‍රමය සේවක සුභසාධන කාර්යයක් සේ සලකා විශ්වවිද්‍යාලය මගින් වසරකට එක් සේවක භවතෙක් වෙනුවෙන් රු. 15,000/- වෙන් කරනු ලැබේ.
3. මෙම රක්ෂණාවරණය ක්‍රියාත්මක කාලය තුල සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට මාරුවීම් ලබා ගන්නා හෝ සේවකභවතුන් වෙනුවෙන් රක්ෂණාවරණය වෙනුවෙන් දැරූ මුදල පහත පරිදි අය කර ගනු ලැබේ.
   1. සේවයෙන් විශ්‍රාම ගන්නා සේවකභවතුන් තමන් විශ්‍රාම ලැබූ දින සිට ඉදිරි මාස සඳහා ගෙවිය යුතු දායක මුදල් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණයෙන් ම දැරිය යුතු ය.
   2. ස්ථාන මාරුවීම් ලද සේවකභවතුන් ස්ථාන මාරුවීම් ලද දින සිට ඉදිරි මාස සඳහා ගෙවිය යුතු දායක මුදල් ඔහු හෝ ඇය විසින් එකවර හෝ මාස්පතා ගෙවිය යුතු ය. මාස්පතා ගෙවන්නේ නම් ඒ සම්බන්ධයෙන් පළමු ව මුල්‍යාධිකාරී සමග සාකච්ඡා කර ගත යුතු ය.
4. හදිසි අනතුරු, රෝහල් සැත්කම් ගාස්තු හා අවදානම් රෝග සඳහා වන ගෙවීම් හා කොන්දේසි මේ සමග අමුණා ඇත.
5. එක් මාසයක් සඳහා වැය වන වාරික මුදල් (ආසන්න වශයෙන් විශ්වවිද්‍යාලය මගින් දරණ පිරිවැය අඩු කොට මෙම ලේඛණය අවසානයේ දක්වා ඇත.
   - තනි පුද්ගල - අදාළ සේවක භවතා පමණි
   - පවුල් ඒකක - 1. විවාහක නම් සේවකයා, කාලත්‍රයා සහ දරුවන්<br>2. අවිවාහක නම් සේවකයා සහ දෙමාපියන්

6. රක්ෂණ යෝජනා ක්‍රමයට දායකවීමට කැමති සේවක භවතුන් මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට 2023.06.12 දින දහවල් 12.00 පෙර ආයතන අංශය වෙත ලබා දිය යුතු ය. එදින ට පසු ව ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

7. මෙම රක්ෂණ යෝජනා ක්‍රමයේ දරු උපත් සඳහා වන waiting period මෙහිදී ඉවත් කර ඇත.

8. මෙම රක්ෂණාවරණ සහ ඒවායේ තොරතුරු සම්බන්ධයෙන් අප සේවකභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ආයතනයේ නිලධාරීන් විසින් විශ්වවිද්‍යා ල පරිශ්‍රයේ දී ඉදිරි සතිය තුළ සිදු කිරීමට නියමිත අතර දිනය සහ වේලාව පසුව දැනුම්දෙනු ලැබේ.

9. රු. 40,000/- රක්ෂණාවරණය සඳහා වන සම්පූර්ණ දායක මුදල විශ්වවිද්‍යාලය මගින් දරනු ලබන අතර එමගින් අප විශ්වවිද්‍යාලයේ සේවක භවතුන්ට සේවක සුබසාධන ප්‍රතිපාදන පදනම මත ලබා දෙනු ලබන විශේෂ ක්‍රමයක් වන අතර එයට සේවක භවතා පමණක් යම් කාණ්ඩ යටතේ විශේෂ කොන්දේසි වලට යටත් ව ආවරණය වේ.

මේ සම්බන්ධයෙන් ඔබ අංශයේ ස්ථිර කාර්යය මණ්ඩල සියළු ම සේවකභවතුන් දැනුවත් කරන මෙන් මෙයින් ඉල්ලා සිටින අතර මේ සම්බන්ධයෙන් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ස්තූතියි

ඩී.එස්.ආර්. විජේවර්ධන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන අධ්‍යයන

වගුව 01

රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා බදු ඇතුළත් ව මාසික වාරික මුදල (දළ වශයෙන්)

| | Plan 01 - A | Plan 01 - B | Plan 02 - A | Plan 02 - B | Plan 03 - A | Plan 03 - B | Plan 04 - A | Plan 04 - B | Plan 05 - A | Plan 05 - B |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 500,000/- (OPD රහිත) | රු. 500,000/- (OPD සහිත) | රු. 300,000/- (OPD රහිත) | රු. 300,000/- (OPD සහිත) | රු. 200,000/- (OPD රහිත) | රු. 200,000/- (OPD සහිත) | රු. 40,000/- (OPD රහිත) | රු. 40,000/- (OPD සහිත) | රු. 100,000/- (OPD රහිත) | රු. 100,000/- (OPD සහිත) |
| තනි පුද්ගල | 2,300/- | 3,310/- | 1,000/- | 2,005/- | 360/- | 1,360/- | විශ්වවිද්‍යාලය මගින් දරනු ලැබේ. | | | 750/- |
| පවුල් ඒකක | 3,850/- | 4,850/- | 1,930/- | 2,950/- | 970/- | 1,980/- | ආවරණය නොවේ. | | | |